පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.02.24 පැය 1250 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/387/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**කේරළ ගංජා තොගයක් ලොරි රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කිලිනොච්චි පොලිස් ස්ථානය.**

වැඩ බලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කර ගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාළව යුද හමුදා බුද්ධි නිලධාරීන්ගෙන් ලද තොරතුරක් මත 2025.02.23 වන දින රාත්‍රී කාලයේ කිලිනොච්චිය පොලිස් වසමේ පරන්තන් අලිමංකඩ අතර ප්‍රදේශයේදී කිලිනොච්චිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදු කර **කේරළ ගංජා කිලෝ 400 ග්‍රෑම් 400 ක් ලොරි රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34 හා 40 වයස් වල පසුවන කිලිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෙම කේරළ ගංජා තොගය පාසර්ල් 182 ක අසුරා ලොරි රථයේ බඳේ සකස් කරන ලද කුටියක සූක්ෂම ලෙස සඟවා තිබියදී සොයාගෙන ඇති අතර ලොරි රථය යාපනය වඩුක්කෝට්ටේ ප්‍රදේශයේ සිට පැමිණ ඇති බවට දැනට සිදු කරන ලද විමශර්න වලදී අනාවරය වී ඇත.

කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**